මහජන ලැදියාවට අයත් වූ අවස්ථාවන්හි පවා, දිවි අහිමි කරගැනීම් පිළිබඳ වාර්තා කිරීමේදී මාධ්‍ය ප්‍රවේශම් සහගත විය යුතු බව දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සම්බන්ධ මාධ්‍ය මාර්ගෝපදේශයන්හි දැක්වේ. එයට හේතුව වන්නේ, එම පුවත් වාර්තාවන් ඔස්සේ ද අනුකාරක දිවි තොර කරගැනීම් සිදුවීමට හැකියාවක් තිබීමයි.

මාර්තු 02 සහ 03 (2022) දිනයන්හි පුවත්පත්වල සහ පුවත් වැඩසටහන්වල සාකච්ඡා කෙරුණු ආර්ථික අපහසුතා සම්බන්ධ දිවි තොර කරගැනීමේ සිදුවීමක් මෙහිදී නිරීක්ෂණය කළ හැක. ඒවායේ දිවි තොර කරගත් ආකාරය සඳහන් වීමත්, හදිසි උපකාරක අංක සඳහන් නොවීමත් ගැටලුකාරී නොවන්නේදැයි පාඨක අප කල්පනා කළ යුතුයි.

1) මෙම පුවත මහජන ලැදියාවට අයත් වුවත්, දිවි අහිමි කරගත් ආකාරය සඳහන් කිරීම මහජන ලැදියාවට අදාළ වේ ද? දිවි අහිමි කරගත් ආකාරය සඳහන් කිරීමෙන් එවැනි ක්‍රමයක් අනුකරණය කිරීමට පෙළඹවීමක්, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවකින් යුතු අයෙකු තුළ ඇති නොවෙතැයි සිතිය හැකිද?.

2) දිවි තොර කරගැනීම් වළක්වාගත හැකි බවට බලාපොරොත්තුවක් ලබා දීම හා උපදේශන සේවා වෙත දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවකින් යුතු අයෙකු යොමු කරවිය හැකි හදිසි උපකාරක අංක මෙවැනි පුවතක් සමගින් පළ කිරීම ඔස්සේ, තවත් ජීවිතයක් බේරාගැනීමේ ඉඩක් නොලැබෙනු ඇතිද?

(මෙම පුවත එම දිනයන්හි සහෝදර ඉංග්‍රීසි පුවත්පත්වල පළ වී නොතිබුණි).

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

https://media.samaritans.org/.../Guidance_for_reporting...

https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...